**නැගෙනහිර පලාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය - 2016**

**----------------------------------------------------------------------**

නැගෙනහිර පලාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 98 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4.8(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ අවබෝධතා ගිවිසුමට අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පලාතේ ජල සැපයුම් පහසුකම පුළුල් කිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය ලබා දීම හා ඒ තුලින් ප්‍රදේශයේ මිනිසුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 7,703 කට සමාන ජපන් යෙන් මිලියන 6,054 ක් වූ අතර ඉන් රු.මිලියන 6,239 කට සමාන ජපන් යෙන් මිලියන 4,904 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජුලි මස ආරම්භ කරන ලද අතර 2013 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලය 2018 ජනවාරි 23 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ

තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් 2016 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද එකතුව රු.මිලියන 639.11 ක් වූ එකතු කළ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අය කර ගන්නා ලද පිළිවෙලින් රු.මිලියන 91.45 ක් හා රු.මිලියන 25.47 ක් වූ පොළී හා බැදීම් ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

**2.2.2 නොසැසඳූ ශේෂ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර හරහා ණය නියෝජිතායතනයෙන් ඉල්ලුම් කරන ලද එකතුව රු.මිලියන 5,315.45, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ඉල්ලීම් පත්‍රවල වටිනාකම වූ එකතුව රු.මිලියන 6,487.47 සමඟ එකඟ නොවිනි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඉටු කල කාර්යයන්ගේ කෙරී ගෙන යන වැඩවල වටිනාකම රු.මිලියන 5,383.90 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල අදාල වටිනාකම රු.මිලියන 5,288.90 ක් ලෙස දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී සහ 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුම් අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම්** | **උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|
| | | | | **සමාලෝචිත වර්ෂය තුළ** | **2016 දෙසැම්බර් 31 දිනට** |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන. | රු. මිලියන | රු. මිලියන |
| ජජාසනි | 4,904 | 6,239 | 1,065.00 | 1,062.19 | 5,315.45 |
| ශ්‍රීලංර | 1,150 | 1,464 | 144.80 | 96.00 | 603.43 |
| එකතුව | 6,054 | 7,703 | 1,209.80 | 1,158.19 | 5,918.88 |

## 3.2 භෞතික ප්‍රගතිය

ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සම්පූර්ණයෙන් නිම කර තිබුණි. කෙසේ වුවද 2018 වර්ෂයේ සිදු කල වැඩ බිම් පරීක්ෂාවේදී, කොන්ඩවටුන, මහඔය සහ දෙහිඅත්තකණ්ඩිය ජල යෝජනා ක්‍රම යටතේ ජල සමේප්‍රෂණ හා බෙදා හැරීම් නල එලීම් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබූ බව අනාවරණය විය.

## 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133 හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක 5 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ණය නියෝජිතායතනයෙන් ලද රු.මිලියන 5,315.45 ක් වූ ලැබීම් වටිනාකම රු.මිලියන 1,384.25 ක් වූ ණය හා රු.මිලියන 3,931.19 ක් වූ ප්‍රදාන ලෙස බෙදා වෙන් කර දක්වා තිබුණි. කෙසේ වුවද 2016 දෙසැම්බර් 31 දින වන විටත් උප ණය ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 626 අනුව පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පවත්වාගෙන යන වෙන්වූ ගිණුම්කරණ වාර්තා මත පදනම්ව එක් එක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. කෙසේ වුවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කරන සමාන ව්‍යාපෘතිවල ලැබීම් හා ගෙවීම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපෘති ගිණුම් අංශය පවත්වාගෙන යන තනි මුදල් පොතෙහි වාර්තා කර තිබුණි.

(ඈ) මුදල් අමාත්‍යාංශයේ 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 හි අවශ්‍යතාවයන්ට අනුව ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.